ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය : www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **සන්නිවේදන දෙපාර්තමේන්තුව** |
| දිනය | **2018.01.16** |

## ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කෙරෙන ප්‍රකාශයයි

2008-2014 කාල සීමාව තුළ රජයේ සුරැකුම්පත් නිකුත් කිරීමේදී කිසියම් අක්‍රමිකතාවක් සිදු වී ඇත්ද යන්න පිළිබඳව වහාම ප්‍රකාශයක් කරන ලෙස මහ බැංකුව වෙත ඉල්ලීමක් ඉදිරිපත් වී ඇත.

මෙහිදී 2018 ජනවාරි 11 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබූ ප්‍රකාශය වෙත අවධානය යොමු කරනු ලැබේ. එහි අවසාන ඡේදයෙහි වෝහාරික විගණනයක් සිදු කිරීම පිළිබඳව සඳහන් කොට ඇත. එකී විගණනයේදී 2008-2014 කාල සීමාව තුළ සිදු වූ රජයේ සුරැකුම්පත් සහ සේවක අර්ථ සාධක අරමුදල සම්බන්ධ කටයුතු පිළිබඳ විමසා බැලෙනු ඇති අතර මෙම විගණනය බාහිර පාර්ශවයක් විසින් සිදු කෙරෙනු ඇත. වෝහාරික විගණනය අවසාන වීමට පෙර මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රකාශයක් සිදු කිරීම යෝග්‍ය නොවේ.